# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## සේවක අර්ථසාධක අරමුදල්
## (සංශෝධන)

**1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

---

කම්කරු අමාත්‍යතුමා විසින් 2021 සැප්තැම්බර් මස 21 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2021 සැප්තැම්බර් මස 07 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

[70 වන පනත් කෙටුම්පත]


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

මිල : රු. 12.00 තැපැල් ගාස්තුව : රු. 15.00

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

***2 වන වගන්තිය*** : මේ වගන්තිය මඟින්, 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ 47 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වූ එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ, ශ්‍රී ලංකාව සමාජ ආරක්ෂණ ගිවිසුමක් පවත්වාගෙන යනු ලබන්නේ කවර රටක් සමග ද, එම රටේ සමාජ ආරක්ෂණ වැඩසටහනක් සඳහා දායක වන යම් ජාත්‍යන්තර සේවකයකු, එම ගිවිසුමේ දක්වා ඇති කාලසීමාව තුළ ඉහත කී පනත යටතේ දායක මුදල් ගෙවීමෙන් නිදහස් කිරීම වේ.

## සේවක අර්ථසාධක අරමුදල්
## (සංශෝධන)

එල්.ඩී.— ඕ. 35/2019

### 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වීමේ දිනය

**1.** මේ පනත 2021 අංක  දරන සේවක අර්ථසාධක අරමුදල් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, ගැසට් පත්‍රයේ පළකරනු ලබන නියමයක් මඟින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබිය හැකි දිනයක සිට එය ක්‍රියාත්මක විය යුතු ය.

1958 අංක 15 දරන පනතේ 47 වන වගන්තිය සංශෝධනය කිරීම

**2.** 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ 47 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) "සේවා නියුක්තයා" යන අර්ථ නිරූපණයේ "ඒ තැනැත්තා ද ඇතුළත් වේ." යන වචන වෙනුවට "ඒ තැනැත්තා ද ඇතුළත් වන අතර, සමාජ ආරක්ෂණ ගිවිසුමක නිශ්චිතව දක්වා ඇති කාලසීමාව සඳහා, එම සමාජ ආරක්ෂණ ගිවිසුම අදාළ වන යම් වියුක්ත සේවකයකු ඇතුළත් නොවේ." යන වචන ආදේශ කිරීමෙන්;

(2) "ආවරණ සේවා නියුක්තිය" යන අර්ථ නිරූපණයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අර්ථ නිරූපණය ඇතුළත් කිරීමෙන් :—

> ""වියුක්ත සේවකයා" යන්නෙන්, ශ්‍රී ලංකාවේ ආවරණ සේවා නියුක්තිය තුළ තාවකාලික පැවරුමක් මත සිටින, තමා පුරවැසියකු වන රටෙහි සමාජ ආරක්ෂණ වැඩසටහනක් සඳහා දායක වන්නා වූ ද, සමාජ ආරක්ෂණ ගිවිසුමක් ප්‍රකාරව යම් කාලසීමාවක් සඳහා මේ පනත යටතේ යම් දායක මුදලක් ගෙවීමෙන් නිදහස් කරනු ලැබ ඇත්තා වූ ද, ජාත්‍යන්තර සේවකයකු අදහස් වේ;";

(3) "සේවා යෝජකයා" යන අර්ථ නිරූපණයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අර්ථ නිරූපණය ඇතුළත් කිරීමෙන් :—

" "ජාත්‍යන්තර සේවකයා" යන්නෙන්, ශ්‍රී ලංකාව හැර වෙනත් රටක පුරවැසියකු වන සේවා නියුක්තයකු අදහස් වේ;";

(4) "නියෝග" යන අර්ථ නිරූපණයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අර්ථ නිරූපණය ඇතුළත් කිරීමෙන් :—

" "සමාජ ආරක්ෂණ ගිවිසුම" යන්නෙන්, ශ්‍රී ලංකාව පාර්ශ්වයක් වන සහ වියුක්ත සේවකයකු වශයෙන් තාවකාලික පැවරුමක් මත වෙනත් යම් රටක සේවය කරන යම් රටක පුරවැසියකු වෙත එම වෙනත් රටේ සමාජ ආරක්ෂණ වැඩසටහනක් සඳහා දායක වීමෙන් නිදහස් කිරීමක් ලබාදෙන ද්විපාර්ශ්වික ගිවිසුමක් අදහස් වේ;".

**3.** මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.